# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1679/39 - 2010 නොවැම්බර් 10 වැනි බදාදා - 2010.11.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක : 31.

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

12 (2) වැනි වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 12(2) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින් කිසිම නිෂ්පාදකයෙකු, බෙදාහරින්නෙකු හෝ වෙළෙන්දෙකු විසින් දේශීයව නිෂ්පාදනය කරනු ලබන දත් බුරුසු ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කරනු ලබන SLS භාණ්ඩ සහතික ලාංඡනය එම එක් එක් දත් බුරුසු ඇසුරුමෙහි ප්‍රකටව පෙනෙන ස්ථානයක පැහැදිළිව ලකුණු කරන්නේ නම් මිස එකී දත් බුරුසු තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් හෝ නිෂ්පාදනය කිරීම, බෙදා හැරීම, ගබඩා කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් විධාන කරනු ලැබේ.

දත් බුරුසු සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර - SLS 276

මෙම විධානය වර්ෂ 2011 ජූනි මස 01 වන දින සිට බලපැවැත්වනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2010 නොවැම්බර් මස 10 වැනි දින,
කොළඹ,
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ දී ය.

11-743

IA - G 13735— 480 (2010/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.